(17)
1-2

චක්‍රලේඛ අංක:- 2003/11

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

නො.7, ග්‍රෙගරි මාවත ,කොළඹ 07
இல 7, கிரகறிஸ் மாவத்தை, கொழும்பு 07
No.7 , Gregory's Avenue, Colombo 07

ෆැක්ස්: / பெக்ஸ் : / Fax : 684051
ඊමේල් : / ஈ-மெயில்: / E-mail : Landcom@sltnet.lk

චක්‍රලේඛ අංක–2003/11

මගේ අංකය: / எனது இல: / MY NO : 5/2/6/චක්‍රලේඛ

ඔබේ අංකය : / உமது இல : / YOUR NO:

දිනය : / திகதி : / DATE : 2003-10-01

සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත,

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රේඛාචිත්‍ර නිකුත් කිරීම හා දීමනාපත්‍ර අවලංගු කිරීම පිළිබඳ උපදෙස්

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජයභූමි දීමනාපත්‍ර මගින් බෙදා දී ඇති ඉඩම් සඳහා රේඛාචිත්‍ර සකස් කිරීමට මැනුම් නියෝග කඩිනමින් නිකුත් කිරීම සඳහා දැනටමත් මවිසින් ඔබ වෙත දන්වා ඇත. මෙම මැනුම් නියෝග සම්බන්ධයෙන් මැනුම්පති විසින් ඔහුගේ ක්ෂේත්‍ර නිලධාරීන් වෙත නිකුත්කර ඇති ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ අංක 3(1) 2003 දරණ චක්‍රලේඛයෙන් ලබාගත් උද්ධෘතයක සටහනක් පහත දක්වමි.

"ජයභූමි ඔප්පු නිකුත්කරන ලද එහෙත් මැනුම් කටයුතු නොකර ඇති ඉඩම්වල මැනුම් කිරීමේ දී අදාළ ඉඩම් ලාභියා සහ ප්‍රදේශභාර ග්‍රාම නිලධාරී එම එක් එක් ඉඩම්වල මායිම් පෙන්වා දිය යුතු අතර එම දෙදෙනාම පැමිණ සිටීම අනිවාර්ය වේ. තවද එහි දී දෙපාර්තමේන්තු රෙගුලාසිවලට අනුව ප්‍රායෝගික ලෙස ප්‍රවේශ මාර්ග, රක්ෂිත බිම් තීරු යනාදිය සඳහා මැනුම් කටයුතු කළ නොහැකි අවස්ථා ඇති නම් එම කට්ටිවලට අදාළ මැනුම පිළිබඳව මිනින්දෝරුවරයාගේ යෝජනා ඇතුළත් අනුරේඛණයක් පිළියෙලකර විස්තර වාර්තාවක්ද සමඟ අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කරන්න. ඉතිරි ප්‍රදේශවල වැඩ නිමකර මැනුම් නියෝගය සම්පූර්ණ කළ හැක. අත්හරින ලද ප්‍රදේශ පිළිබඳව එම යෝජනා පිළිබඳ ඔහුගේ තීරණ ඇතුළත් මැනුම් නියෝගයක් එවන ලෙස ද ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවන්න. එය ලදවිට මැනුම් කටයුතු කළ හැක."

මේ අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ජයභූමි සඳහා රේඛාචිත්‍ර සකස් කරන අවස්ථාවලදී එම ඉඩම් මුලින් මැන නොතිබීම නිසා සෑම ඉඩමකටම මාර්ග වැනි පොදු පහසුකම් සපයාදීම ගැටළුවක් බවට පත් වී ඇති අවස්ථා ඇත. එවැනි අවස්ථාවලදී මිනින්දෝරුඅධිකාරී විසින් ඊට අදාළ අනුරේඛණයක් සකස්කොට ඔබ වෙත ඉදිරිපත් කරනු ඇති අතර අදාළ භාරශයක කැඳවා පාරවල් හා අනෙකුත් පොදු අවශ්‍යතා සඳහා ඉඩම් වෙන්කළයුතු ආකාරය පිළිබඳව ඔබ විසින් තීරණයකොට එම තීරණ මිනින්දෝරුඅධිකාරී වෙත දැනුම් දිය යුතුය. ඒ අනුව මිනින්දෝරුඅධිකාරී විසින් එකී නියෝගය පරිදි කටයුතු කර මැනුම්කර රේඛාචිත්‍ර සකස්කරනු ඇත. යම් හෙයකින් ඔබට එම ගැටළුව නිරාකරණය කරගැනීමට නොහැකි වුවහොත් ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සහිතව පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත ඉදිරිපත් කරන්න.

මෙම මැනුම් නියෝග යැවීම සම්බන්ධයෙන් ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට සතුටුදායක නොවන බව පළාත් ඉඩම් කොමසාරිස්වරුන් විසින් මා වෙත එවා ඇති වාර්තා අනුව පෙනී යයි. එබැවින් මේ සම්බන්ධයෙන් ඔබගේ පුද්ගලික අවධානය යොමු කරනලෙස නැවත වරක් කරුණාවෙන් දන්වමි.මෙම මැනුම් නියෝග යැවීම සම්බන්ධයෙන් ඔබගේ ප්‍රගතිය වාර්තා කිරීමේ දී දින 100 වැඩ සටහන යටතේ මවිසින් එවනු ලැබූ උපදෙස් අනුව නිකුත් කරන ලද මැනුම් නියෝග ගණන, කට්ටි ප්‍රමාණය හා ලද රේඛාචිත්‍ර සංඛ්‍යාවත් ඇතුළත් කිරීමට කරුණාකර පියවර ගන්න.

මැනුම් නියෝග යැවීමේ දී එක් යායට පිහිටි ඉඩම් කැබලි සඳහා එක් මැනුම් නියෝගයක් උපලේඛණයක් සහිතව යැවීමට මගේ අංක 2003/02 චක්‍රලේඛයෙන් උපදෙස් දී ඇති අතර එම උපලේඛණ සකස්කර ගැනීමට කාලයක් ගතවන බවට පළාත් ඉඩම් කොමසාරිස්වරුන් විසින් මා වෙත දැනුම් දී ඇත. ඔබගේ විෂය ලිපිකරුවන්ට මේ සඳහා ප්‍රමාණවත් කාලයක් වැයකළ නොහැකි නම් ඒ සඳහා විකල්පයක් වශයෙන් ග්‍රාම නිලධාරීවරුන්, සමෘද්ධි නිලධාරීන් වැනි අයගෙන් සහාය ලබාගෙන හෝ මෙම කාර්යය කඩිනමින් කිරීමට කරුණා කර පියවර ගන්න.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත්කර ඇති අවස්ථාවල දීමනාපත්‍රකරු හා කලත්‍රයා මියගියපසු ඉඩමට හිමිකම් ලබාගැනීමට උරුමකරුවන් කිසිවෙකු නැති අවස්ථාවලදී පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීම සඳහා කටයුතු කළ හැක. එහෙත් මේ සඳහා නිශ්චිත වශයෙන් උරුමකරුවෙකු නැති බව තහවුරු කරගත යුතුය. ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් දැනට නොමැති බැවින් ගැසට්පත්‍රයේ හෝ ජාතික පුවත්පතක භාෂාත්‍රයෙන්ම දැන්වීමක් ප්‍රසිද්ධ කිරීම වඩාත් කාලෝචිත හා සුදුසු ක්‍රමය යැයි සිතමි. එබැවින් මින් ඉදිරියේ දී පනතේ 104 වගන්තිය යටතේ දීමනාපත්‍රයක් අවලංගු කිරීමට ඇති අවස්ථාවලදී මේ සමඟ ඇති ආකෘතියේ ප්‍රකාර දැන්වීමක් භාෂා තුනෙන්ම සකස්කොට ගැසට්පත්‍රයේ පළ කිරීමට පියවර ගන්න. ප්‍රමාණවත් ප්‍රතිපාදන ඔබ වෙත ඇත්තේ නම් පුවත්පත්වල පළ කිරීම ද සුදුසු බව යෝජනා කරමි. එසේ දැන්වීම් පළකර නිශ්චිත කාලය ඉක්මවා ගියපසු එම තොරතුරු පැහැදිලි කරමින් වාර්තාවක් අදාළ දීමනාපත්‍රයේ මුල් පිටපත ද සමඟ පළාත් ඉඩම් කොමසාරිස් මගින් මා වෙත එවූ පසු ජනාධිපතිතුමියගේ අනුමැතිය ඒ සඳහා ලබාගෙන ඔබ වෙත එවීමට මවිසින් ක්‍රියාකරනු ඇත.

එස්.ජේ.පතිරණ
ඉඩම් කොමසාරිස්.

පිටපත:- 1. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය.
2.මිණුම්පති.
3.පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.
4.නියෝජ්‍ය/ සහකාර ඉඩම් කොමසාරිස්වරුන්.

b)

මගේ අංකය
எனது இல.
My No. } වක්‍රලේඛ අංක:- 2001/1

ඔබේ අංකය
உமது இல.
Your No. }

ෆැක්ස්
தொலைநகல்
Fax } 684051

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT

අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7-00700
இல. 7, கிரகறிஸ் மாவத்தை, கொழும்பு 7-00700
No. 7, Gregory's Avenue, Colombo 7-00700

2000. 12 - 13

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම හා රජයට භාරගෙන අවලංගු කිරීම

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති මගේ 91/03 හා 94/08 වක්‍රලේඛ කෙරෙහි ඔබගේ අවධානය නැවත වරක් යොමු කරවනු කැමැත්තෙමි.

02. ඉහත වක්‍රලේඛ වල උපදෙස් හා ක්‍රියා මාර්ග අනුගමනය නොකිරීම හේතුවෙන් වැරදි සහගත දීමනාපත්‍ර සකස්කර ඇති අවස්ථා රාශියක් වාර්තා වී ඇත. මෙවැනි අවස්ථා අතර, බලපත්‍රකරුගේ කලත්‍රයාට ජීවිත භුක්තිය දිය යුතු අවස්ථා වල ඒ වෙනුවට මුල් අයිතිය ලබා දී දීමනා පත්‍ර නිකුත් කිරීම, ක්ෂේත්‍රයේදී ඉඩම පරීක්ෂා කිරීමකින් තොරව කාර්යාලයේ ඇති ඉඩම් ලේජරය බලා දීමනාපත්‍ර සකස් කිරීම නිසා ඉඩම වර්තමානයේ භුක්ති විඳින පුද්ගලයින්ගේ ගැටළු වලට විසඳුම් දීමට නොහැකි වීම විශේෂයෙන් පෙනේ. මෙසේ දීමනාපත්‍රයක් නිකුත් කළ පසු එය අවලංගු කිරීමට ක්‍රමයක් නොමැතිවීම නිසා බරපතල ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුව ඇත.

03. මෙම හේතූන් නිසා දීමනාපත්‍ර සැකසීමේදී කාර්යාලයේ ඇති ලේඛණ එනම්, ඉඩම් ලේජරය හා බලපත්‍ර පිටපත් පමණක් උපයෝගි කර ගෙන කිසිම අවස්ථාවක දීමනාපත්‍ර නිකුත් නොකළ යුතු බවත්, අනිවාර්යයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණයක් කළ යුතු බවත්, නැවත වරක් අවධාරයෙන් සිහිගන්වනු කැමැත්තෙමි.

04. දීමනා පත්‍ර සකස් කිරීමට පෙර ක්ෂේත්‍ර නිලධාරීන් විසින් අදාල ඉඩම් පරීක්ෂා කර බලපත්‍රලාභීන් ඉඩම භුක්ති විඳින්නේද, ඉඩම සංවර්ධනය කර තිබේද යන කරුණු ගැන වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. මුල් ඉඩම් ලාභියා ඉඩම භුක්ති නොවිඳී නම්, උරුමකරුවන්ට භාරවා දීම හෝ පිටස්තර අයෙකු සිටී නම් පනතේ විධිවිධාන අනුව ඉඩම් අවලංගු කර වර්තමානයේ ඉඩම භුක්ති විඳින්නන්ගේ සුදුසුකම් පරීක්ෂා කර ඔවුනට ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන අදාල වාර්තාව යොමු කළ යුතුය.

05. එසේම දීමනාපත්‍ර යටතේ නිකුත් කර ඇති අතුරු බෙදීම් වලට අවසර නොමැති දීමනාපත්‍ර, අතුරු බෙදීම් කිරීමට අවශ්‍ය වන විටදීත් , පවුලේ දරුවන් අතර, කැබලි කර බෙදාදීමට අවශ්‍ය වන විටදීත්, ඉඩමේ කොටසක් පිටස්තර ගොවි පන්තියේ තැනැත්තෙකුට බැහැර කිරීමේදීත් , එවැනි දීමනාපත්‍ර අවලංගු කිරීම සඳහා රජයට භාර ගන්නා අවස්ථාවලදී එසේ කිරීමට පළාත් ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. එහෙත් එසේ අනුමැතිය ලබා නොගෙන දීමනා පත්‍ර රජයට භාරගෙන ක්‍රියා පටිපාටිය අවලංගු කර එම දීමනාපත්‍ර නැවත නිකුත් කිරීමට මා වෙත යොමු කෙරෙන ඇතැම් ඉල්ලීම් වලට එකඟ වීමට නොහැකි බැවින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ආපසු එවා ඇත. එවැනි දීමනාපත්‍ර නැවත වලංගු භාවයට පත් කිරීමට නොහැකි වනු ඇත. එබැවින් මෙසේ දීමනා පත්‍ර අවලංගු කිරීමට රජයට භාර ගැනීමට පෙර ඊ සඳහා පළාත් ඉඩම් කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

06. අතුරු බෙදීම් වලට අවසර නැති දීමනාපත්‍ර අවලංගු කර අතුරු බෙදීම් සහිත දීමනාපත්‍ර ල ගැනීම සඳහා එවනු ලබන දීමනාපත්‍ර පිළිබඳව පහත සඳහන් ක්‍රියා මාර්ගයන් අනුගමනය කරන ලෙසද කරුණාවෙන් දන්වමි.

I. අතුරු බෙදීම් සඳහා අවසර නැති දීමනාපත්‍ර අතුරු බෙදීම් වලට අවසර ඇති දීමනා පත්‍ර වශයෙන් ලබා දෙන ලෙසට ඉල්ලීම් ලද විට ඒ ගැන පළාත් ඉඩම් කොමසාරිස්ට වාර්තා කර ඔහුගේ අනුමැතිය ලබාගෙන දීමනාපත්‍ර ලාභින්ගේ කැමැත්ත අනුව ප්‍රාදේශීය ලේකම් විසින්ම රජයට භාරගත යුතුය.

II. එම දීමනා පත්‍රයේ ලියා පදිංචිය අවලංගු කර එම අංකයෙන්ම නව දීමනාපත්‍රයක් (ඉ.කො. 156 ආකෘතිය) සකස්කර දීමනාපත්‍රය රජයට භාර ගැනීමේ සහ ලියා පදිංචිය අවලංගු කිරීමේ සහතික වල පිටපත් සමඟ ප්‍රාදේශීය ලේකම්ගේ විස්තර වාර්තාව පළාත් ඉඩම් කොමසාරිස්ගේ මාර්ගයෙන් එවිය යුතුය.

07. ඊට අමතරව ඇති අවස්ථා වලදී පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුය.

I. දීමනාපත්‍ර ලාභියා මියගොස් ඇති විටක කලත්‍රයා නමින් ජීවිත භුක්තියට යටත්ව නව දීමනා පත්‍රය සකස් කර ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශය සමඟින් එවිය යුතුය.

II. දීමනාපත්‍රලාභියා සහ කලත්‍රයා යන දෙදෙනාම මියගොස් ඇති විටක 155 ආකෘතිය මඟින් ලියා පදිංචි කර ඇති පසු උරුමකරු නමින් අදාළ දීමනා පත්‍රය සකස් කර , ඒ පිළිබඳව විස්තර වාර්තාවක් පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සමඟ එවිය යුතුය.

III. පසු උරුමකරු නම් කර නොමැති අවස්ථාවකදී ප්‍රාදේශීය ලේකම් විසින් පරීක්ෂණයක් පවත්වා ඉ.සං.ආ. පනතේ III වන උපලේඛණය අනුව උරුමකරු තීරණය කර ඒ අය නමින් දීමනා පත්‍රය සකස්කර ප්‍රා.ලේ. නිර්දේශ පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සමඟ එවිය යුතුය.

08. ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන වලට පටහැනිව දීමනා පත්‍ර සකස්කර ඇති අවස්ථා වලදී ඒ පිළිබඳව එම වරද සිදුකළ නිලධාරියාගෙන් /නිලධාරීන්ගෙන් නිදහසට කරුණු විමසා එක් එක් සිද්ධිය සම්බන්ධව වෙන වෙනම වාර්තා සකස් කර එවන මෙන් කාරුණිකව දන්වමි.

එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස්.

පිටපත්:

1. ලේකම්,
ඉඩම් සංවර්ධන හා සුළු අපනයන කෘෂිකර්මාන්ත අමාත්‍යාංශය.

2. සියළුම දිසා ලේකම්වරුන්.

3. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්.

4. දෙපාර්තමේන්තුවේ සියළුම මාණ්ඩලික නිලධාරීන්.

3

253

5/2/6/මැනුම්පත්‍ර                                                    2004.12. 15

සියළුම පළාත් ඉඩම් කොමසාරිස් වරුන් වෙත.

## ජයභූමි දීමනාපත්‍ර ලබාදී ඇති ඉඩම් සඳහා මැනුම් කටයුතු

ඉහත කරුණට අදාලව මැනුම් පතිවද පිටපත් සහිතව ඔබ වෙත යොමුකළ මගේ සමාංක හා 2004.11.22 දිනැති ලිපියට අමතර වශයෙනි.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් අවසාන පිඹුරු සකස් කර තිබුනද ඒවා භාවිතා කිරීමකින් තොරව ජයභූමි දීමනා පත්‍ර බොහෝ ප්‍රමාණයක් සකස් කර ඇති බව පෙනී ගොස් ඇත. එවැනි ජයභූමි ඉඩම් මැණ පිඹුරක් සකස් කරගැනීමට අවශ්‍ය වූ විට පෞද්ගලික මිනින්දෝරු වරුන් විසින් එම ඉඩම් මැණ ගැනීමට ඔවුනට උපදෙස් දීම වෙනුවට, එවැනි ඉඩම් සඳහා අවසාන පිඹුරු ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත ලැබී ඇත්නම් දීමනා පත්‍රයෙහි සඳහන් සතර මායිම් හා ප්‍රමාණය එකී පිඹුර අනුව ගැලපේනම් එවැනි විටකදී එකී පිඹුරේ පිටපතක් ඉඩම් ලාභියාට ලබාදීමෙන් ඔහුගේ ගැටළුව විසඳාගත හැකි වනු ඇත. එබැවින් ඒ අනුව කටයුතු කරන ලෙස කාරුණාකර ප්‍රාදේශීය ලේකම් වරුන්ට උපදෙස් දෙන්න.

ඔ/ඉ එස්.ජේ.පතිරණ,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්.
1 මැනුම්පති, මැනුම්පති කාර්යාලය, කොළඹ 05